#MediaEthicsSL #EnglishPress #SinhalaPress #TamilPress #lka #DailyNews #DailyMirror #TheIsland #CeylonToday #Divaina #Dinamina #Lankadeepa #Ada #Rasa #Thinakaran #Virakesari #Thinakkural #DailyFT #Mawbima #December04

දෙසැම්බර් සිව්වු වන දින සිංහල, දමිළ හා ඉංග්‍රීසි භාෂා පුවත්පත් මගින් මහින්ද රාජපක්ෂව හඳුන්වා දී තිබූ ආකාරය අප විසින් නිරීක්ෂණය කළ අයුරු පහත දැක්වේ.

මෙයට පෙරද අප විසින් නොවැම්බර් 14 දින ආණ්ඩුව කෙරෙහි වූ විශ්වාස භංග යෝජනාව සම්මත වූ හෙයින් අමාත්‍ය මණ්ඩලය විසුරුණු බවට නිල ප්‍රකාශයක්ද නිකුත් වූ පසුවත්, මහින්ද රාජපක්ෂ යනු ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා ලෙසින් පුවත්පත් තුළ හැඳින්වීම උචිත වේද යන පැනය අසා සිටියෙමු.

දෙසැම්බර් සිව්වු වන දින පුවත්පත් තුළ මහින්ද රාජපක්ෂ සම්බන්ධයෙන් වන සඳහන් නිරීක්ෂණය කිරීමේදී අවධාරණය කළ යුතු කරුණ වන්නේ, මහින්ද රාජපක්ෂ අගමැති වශයෙන් කටයුතු කිරීම සහ ඔහුගේ කැබිනට් මණ්ඩලයේ කටයුතු තාවකාලිකව අත්හිටුවමින් දෙසැම්බර් තුන් වැනි දින අභියාචනාධිකරණයෙන් අතුරු තහනම් නියෝගයක් නිකුත් කළ බවයි. එවැනි පසුබිමක් යටතේ මහින්ද රාජපක්ෂ යනු අග්‍රාමාත්‍යවරයා ලෙසින් පුවත්පත් තුළ සඳහන් කිරීම කෙතරම් යෝග්‍ය වේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?